
# සුදූගේ සිහිනය



මිහින්දි මෙත්සඳි යාපා

# සුදූගේ සිහිනය


## මිහින්දි මෙත්සදි යාපා

කතෘ


කතෘගේ වෙනත් කෘති

- සමනල පැංචී
- අසිරිමත් අහස (සම කතෘ: මිහින් මෙත්සිළු යාපා)


මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

හතරවන ශ්‍රේණිය (බී)



08/02/2025

ISBN: 978-624-208-800-6



සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයන්ගේ නිසි අවසරයකින් තොරව මෙම ග්‍රන්ථය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ උපුටාගැනීම, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික ආදී කවර මාධ්‍යකින් හෝ පිටපත්කිරීම, පළකිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවිකිරීම, බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම්වේ

# පිදුම

නිතරම ආදරයෙන් හැම දේම කියා දෙන වත්සලා ගුරුතුමියටත්,

මෙවැනි කටයුතු වලට නිතරම උනන්දු කරන සමන්මලී ගුරුතුමියටත්

අනෙකුත් සියළුම ගුරුවරුන්ටත්,

සැමවිටම මා ළඟින්ම සිටින

මගේ ආදරණීය,

තාත්තාට,

අම්මාට,

අයියාට

හා

සීයාට.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණ ගත්කරණී" ව්‍යාප්ෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


# සුදූගේ සිහිනය

සුදූ කියන්නේ පුංචි ළමයෙක්. එක දවසක් රෑ, සුදූ, රසම රස හීනයක් දුටුවා.





එම සිහිනයේදී සුදූ සිටියේ අහසේ. ඒ වෙනදා දකින විදියේ අහසක් නොවේ, පැණි රස අහසක්. ලස්සනට ඉර පායලා. ඒත් පරිසරය සීතලයි. සුදූ හිටියේ වලාකුළු උඩ. මුළු පලාතම වලාකුළු නිසා සුදූම සුදු පාටයි. එහි ඉතා ලස්සන දේදුන්නක් තිබිණි.






සුදූ දැක්කා, ළඟ තිබුණු ගෙදරක්. සුදූ ගෙදර ඇතුලට ගියා.  සුදූ ගෙදර කාමර දැකලා පුදුම වුණා. ඒ කාමර ලස්සනම ලස්සනයි. එහි පුටු සාදා තිබුනේ චොකලට් වලින්. එහි රසම රස කැම තිබිණි. ඇඳන්, මෙට්ට, කොට්ට සැදී තිබුණේ වළාකුලු වලින්. සුදූ ඒ ගෙදර පදිංචි වුණා.










ඉතින් සුදූ වෙනදා වගේම උදෙන්ම නැගිටලා දත කට මැදගෙන ගමනක් යන්න සූදානම් වුණා. එතකොටම සුදූගේ යළුවා, හිරුණි එතනට ආවා. හිරුණි, අපි ගමනක් යමුද? සුදූ ඇහැව්වා. හා හා යමු යමු, හිරුණි ආසාවෙන් පිළිතුරු දුන්නා.








එහෙනන් අපි බඩු ටික දාගමු. සුදූ කිවුවා. ඉතින් ටික වේලාවකට පස්සෙ දෙන්නම බඩු ටික ලැස්ති කරගත්තා. හරි අපි ගමන යන්න පටන්

ගමු දෙන්නාම එක හඬින් කෑගැහැව්වා. දෙන්නාම ගෙදරින් එළියට ආවා. එළිය හරිම ලස්සනයි. පාට පාට ගස්, පාට පාට මල් හැමතැනම.



මේ ගස් වැල් මල් හැම දෙයක්ම හැදිලා තියෙන්නේ පාට පාට පැණිරස කෑම ජාතිවලින්. පාර දෙපැත්තේ තිබුණු ගෙවල් හරිම ලස්සනයි. ඒ හැම දෙයක්ම පැණිරස කෑම වලිනුයි හදලා තියෙන්නේ. ඉතින් මේ ගොල්ලෝ ගස් වැල්, ලස්සනම ලස්සන මල් පහුකරගෙන ලොකු කැලෑවකට ආවා. ඒ කැලෑවේ, පාට පාට සමනළයෝ, ලස්සන සිංදු කියන කුරුල්ලෝ, ලේන්නු, දුව පැන සෙල්ලම් කරන හාවෝ, මුවෝ, ඉත්තෑවෝ, ගස් උඩින් පනින වඳුරෝ වගේ සත්තුන්ගෙන් පිරිලා. ඒ කැලෑව ඇතුලට එද්දී ලොකු දිය ඇල්ලකුත් තිබුනා. ඒ දිය ඇල්ලෙන් පහලට වැටුනේ පාට පාට අයිස්ක්‍රීම්.



හිරුණියි, සුදුයි අයිස්ක්‍රීම් දිය ඇල්ලේ නාන ගමන් රස කරමින් අයිස්ක්‍රීම් ඇති වෙනකම් කෑවා. ටික වේලාවකින් දෙන්නා දිය ඇල්ලේන් ගොඩට ආවා.

ඒත් මෙතන හරිම ලස්සන තැනක්. ඒ දෙන්නාට මෙතන දාලා යන්න හිතුනේම නෑ. අනේ හිරුණි අපි අද මෙතන ඉඳිමුද? සුදු ඇහැව්වා. හිරුණිත් හයියෙන් අත්පුඩියක් ගහලා අපි එහෙනම් මෙතන ඉඳිමු කිවුවා.



පස්සේ දෙන්නා එකතු වෙලා ඒ වටේ තියෙන  ගස්වල අතු එකතු කර ගත්තා. ඒ අතු හැදිලා තියෙන්නේ පැණිරස කූරු වලින්. ඊට පස්සේ දෙන්නත් එක්ක ඒ ළඟ තියෙන් තවත් උස ගසක අත්තක් උඩ පුංචි ලස්සන ගෙයක් පැණිරස කූරු වලින් හදා ගත්තා.දෙන්නා ගෙනාපු බඩු ටිකත් පිළිවෙලට අළුත් ගේ ඇතුලෙන් තිබ්බා.



අනේ මෙතන හරිම ලස්සනයි, සුදූ හයියෙන් අත්පුඩි ගසමින් කිවුවා. සුදූ, ඔයාට ගොඩාක්ම ස්තූතියි මාව මෙතෙන්ට ගෙනාවාට හිරුණී කිව්වා.

මටනං දැන් බඩගිනියි වගේ හිරුණී කිවුවා. අපි එහෙනන් මේ කූඩයත් අරගෙන ගිහිල්ලා පැණිරස කෑම ටිකක් එකතු කරගෙන එමු, සුදූ යෝජනා කලා. දෙන්නත් එක්ක  ගසෙන් බැහැලා පැණිරස කෑම එකතු කරන්න ගියා.



ගස් වල පාට පාට ටොෆි, චොකලට්, බිස්කට් වගේ කෑම ජාති පිරිලා. ගස්වල හිටපු ලේන්නු හා කුරුල්ලෝ මේ කෑම කඩලා සුදූ සහ හිරුණි දෙසට වීසි කලා. සුදූයි හිරුණියි කැලය පුරා දුවමින් කෑම එකතු කරගත්තා.


සවස් වෙනවිට කෑම ටිකත් එකතු කරගෙන ලේනන්ට හා කුරුල්ලන්ට ස්තූති කරලා සුදූයි, හිරුණියි එහොල්ලෝ හදාගත්ත ගහ උඩ ගෙදරට ආවා. එකතු කරගත්ත ටොෆි, චොකලට් කන ගමන් දෙන්නත් එක්ක ලස්සන සින්දු කියමින් සතුටු වුනා. සිංදු වලට සංගීතය සැපයුවේ ලේනුන් සහා ලස්සන කුරුල්ලන්. මේ වගේ රස කෑම ජාති මම කවදාවත් කාලා නෑ, සුදූ හිරුණිට කිවුවා. හිරුණිත් හයියෙන් හිනා වෙලා ඒකට ඔළුව වැනුවා.



කරුවල වැටීගෙන එන කොට, මහන්සියටත් එක්කම දෙන්නාටම හොඳටම නින්ද ගියා. ඇහැරෙන කොට පහුවදා එළි වෙලා. වටේම මීදුමෙන් වැහිලා, හරිම හීතලයි. ලේනුන් හීතලටද කොහේද ටිං ටිං කියමින් ගස්වල හැම තැනම දුවනවා. කුරුල්ලෝ ගස් උඩට වෙලා පියපත් අකුලාගෙන සිංදු කියමින් බලාගෙන ඉන්නවා. කඳු අස්සෙන් ඉර එළිය වැටීගෙන එනවා. ගස්වල කොළවල තියෙන පිනි බිංදු වලට ඉර එළිය වැටිලා මැණික් කැට වගේ දිලිසෙනවා. සුදූයි, හිරුණියි ගහෙන් බැහැලා ටිකක් කැලේ ඇවිදින්න කියලා ගියා. පාර දෙපැත්තේ බොම්බයි මොටයි, ටොෆි, චොකලට් පිරිලා. දෙන්නා කැලේ ලස්සන බලමින් ඇවිදින ගමන් ටොෆි, චොකලට්, බොම්බයි මොටයි ඇති තරම් කෑව.



කැලේ මැද්දේ ලස්සන විලක් තිබුණා. ඒ විල පිරිලා තිබුනේ සුදුම සුදුපාට කිරි වලින්. දෙන්නත් එක්ක මේ විලෙන් ඇති වෙනකම් කිරිත් බිවුවා. හරිම රසයි.



මෙහෙම යනකොට සුදු දැක්කා කැලේ මැද වෙව්ලමින් කෙඳිරි ගාන පුංචි කොටි පැටියෙක්. සුදුට හරියට දුක හිතුනා. හිරුණිටත් කොටි පැටියාව පෙන්නුවා. හිරුණිටත් දුක හිතුනා. අපි මේ කොටි පැටියාට උණුසුම දෙන්නේ කොහොමඳ සුදු හිරුණිගෙන් ඇහැව්වා.







මට ආවා අදහසක්, හිරුණි කිව්වා. අපි මේ කොටි පැටියාව ගෙදර අරගෙන යමු. ඒක හොඳ අදහස සුදුත් එකඟ වුනා. සුදු කොටි පැටියාව වඩාගෙන අඳගෙන හිටපු ජර්සියෙන් ඔතාගෙන ඇඟට තුරුළු කරගත්තා. දෙන්නත් එක්ක මේ කොටි පැටියාව ගස උඩ පැලට අරගෙන ආවා.



එත් තාම කොටි පැටියා වෙව්ලනවා. සුදූගේ ජර්සිය ගලවලා කොටි පැටියාට පෙරෙව්වා.






ඊට පස්සේ දෙන්නත් එක්ක කැළයෙන් ගෙනාපු කිරියි, චොකලට්වුයි දාලා උණුම උණු චොකලට් පානයක් හදලා කොටි පැටියාට දුන්නා. කොටි පැටියා ආසාවෙන් ඒක බිවුවා. කොටි පැටියාට තව කෑම ටිකක් ගේන්න ඕනෙ කියලා ගහෙන් බහින්න හැදුවා විතරයි සුදූගේ අත ලිස්සලා එකපාරම ගහෙන් වැටුනා. සුදූට බයටම කෑගැහුනා.



පුතා, පුතා....අම්මාගේ කටහඬ ඇහිලා ඇහැරලා බලද්දී අම්මා ළඟට වෙලා සුදූගේ ඔළුව අත ගගා ඉන්නවා.



"අනේ මගේ ලස්සන හීනය" සුදූට කියවුනේ ඉබේටම.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණිය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

ISBN
9 786242 088006